## සාරාංශය

විධිමත් අධ්‍යාපනයට සම්බන්ධ වන දරුවා එක ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා විධිමත් විෂය මාලාවක් ඔස්සේ අධ්‍යාපන ක්‍රියාවලියේ නිරත වේ. අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සලකන මෙවන් අවධියක රටේ සංවර්ධනයට දායක විය හැකි පුද්ගලයන් බිහි කිරීම අධ්‍යාපනයේ අරමුණකි. මේ අරමුණ ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධානම ආයතනය වන්නේ පාසලයි. වර්තමානයේ සම අධ්‍යාපන අවස්ථා සැලසීමට අපේක්ෂා කරන හෙයින් සම්පත් නාස්තිය අවම කර අධ්‍යාපනයේ උපරිම ප්‍රතිලාභ සිසුන්ට අත්පත් කර දීමට නම් සිසුන් පාසල වෙත පිවිසීම ඉතා වැදගත්ය. පාසල වෙත නොපැමිණිය හොත් එම ප්‍රතිලාභ සිසුන්ට අහිමි වී යයි. මෙම අහිමිවීම අවම කිරීම සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීමේ ප්‍රවණතාවය අඩුවීම පිළිබඳව සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීම හා සම්බන්ධ පර්යේෂණ අනාවරණ මෙම පර්යේෂණය සඳහා ආධාර කර ගන්නා ලද අතර, ප්‍රධාන අරමුණු පහක් ඔස්සේ අධ්‍යයනය සැලසුම් කරන ලදී.

අඛණ්ඩව පාසල් පැමිණීම පිළිබඳව උසස් පෙළ සිසුන්ගේ අදහස් විමසා බැලීම, උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීම අඩුවීම සම්බන්ධයෙන් ගුරුවරුන් දරණ අදහස් සොයා බැලීම, උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීම අඩුවීම පිළිබඳ උසස් පෙළ අංශ ප්‍රධානීන්ගේ අදහස් හඳුනා ගැනීම, උසස් පෙළ සිසුන්ගේ දෙමාපියන් ඔවුන්ගේ දරුවන්ගේ පාසල් පැමිණීම අඩුවීම කෙරෙහි දක්වන අදහස් විමසා බැලීම, උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීම සම්බන්ධව හඳුන්වා දී ඇති අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේදැයි විමසා බැලීම එම අරමුණුවලට අයත් විය.

අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමට සහේතුක නියැදියක් තෝරා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී හා ලේඛන පරිශීලනය මඟින් දත්ත රැස් කෙරිණි. වගු, ප්‍රස්ථාර හා ප්‍රතිශත මඟින් විස්තරාත්මකව දත්ත විශ්ලේෂණය කිරීම සිදු කෙරුණි. අවශ්‍ය අවස්ථාවලදී ප්‍රස්තාර සටහන් ද යොදා ගැනුණි. සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත් තොරතුරු ගුණාත්මකව විශ්ලේෂණය කිරීම ද සිදු කෙරුණි.

දත්ත විශ්ලේෂණයේ දී අනාවරණය වූ කරුණු අනුව උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීමේ ප්‍රවණතාවය අඩුවීමට බලපාන විචල්‍යයන් රැසක් හඳුනාගත හැකි විය. පාසල හා සම්බන්ධ සාධක, පවුල හා සම්බන්ධ සාධක, ශිෂ්‍යයා හා සම්බන්ධ සාධක, පාසල් පරිපාලනය හා සම්බන්ධ සාධක ආදිය ඊට අයත් වේ.

සිසුන්ගේ පැමිණීම වර්ධනය කිරීම සඳහා ගත හැකි පියවර කිහිපයක් යෝජනා කිරීම ද, අනාගතයේ පර්යේෂණයට භාජනය විය යුතු ක්ෂේත්‍ර කිහිපයක් පෙන්වා දීමට ද අවසානයේ දී හැකි විය. සම්පත් නාස්තිය අවම කරමින් උසස් පෙළ සිසුන්ගේ පාසල් ගමන අඛණ්ඩ කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් හඳුනා ගැනීමට මෙම පර්යේෂණය තුළින් හැකියාව ලැබුණි.

## Abstract

Children from grade 01 to 13 receive formal education, through the formal curriculum. Thus when we consider that education is an investment, it produces some resourceful person to nations and their development. School is an important place to fulfill this idea. Presently,equal learning opportunity policy is being practiced in Sri Lanka.

In order to maximize learning outcomes, it is necessary to get the maximum attendance of students. Otherwise, they will lose all the advantages which are provided by the government. So my main target is to investigate the nature of absenteeism of G.C.E. A/L students offering subjects in the commerce and arts stream.

Relationships concerning the attendances of A/L students have been studiedunder five major objectives in this research.

This research has been done by questioningA/L students, teachers and parents. Some opinions of sectional heads too have been analyzed. Meanwhile, some educational policies and reforms too were discussed in this research.

A logical and authentic field has been selected for the research.Data were gathered through interviews, questioner and documents.Data wereanalyzed using tables and graphs.Interviews were analyzed using a qualitative approach.

Several fluctuating facts were identified regarding the absenteeism of A/L student for the study. Some other problems such as school life, administrative problems and family problems are included in this research.

Suggestions have been made here to increase the attendance of the A/L students in the commerce stream. Finally, some suggestions to decrease their regularities concerning the use of resources have been madeIn order to get higher attendance of A/L students.